**DP/OL/2026**

මගේ අංකය : 6/4/OL/2026
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.
2026 ජූලි මස 03 දින

සියලු ම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා හා විදුහල්පතිවරුන් වෙත,

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය - 2026 සඳහා පෙනී සිටීමට නියමිත පාසල් අයදුම්කරුවන්ගේ අයදුම් පත්‍ර සම්පූර්ණ කිරීමේ උපදෙස් පහත පරිදි වේ. අයදුම්පත් භාරගැනීම මාර්ගගත ආකාරයෙන් 2026 ජූලි මස 03 දින සිට 2026 ජූලි මස 23 දින දක්වා සිදු කෙරේ.

**රජයේ පාසලක ඉගෙනුම ලබමින් පෞද්ගලික අයදුම්කරුවන් ලෙස විභාගයට අයදුම් කිරීම සපුරා තහනම් වේ. එසේ පෙනී සිටීමක් අනාවරණය වුවහොත් විභාග ප්‍රතිඵල අවලංගු කර ඉදිරි විභාග සඳහා පෙනී සිටීම ද තහනම් කරනු ලැබේ.**

**01. අයදුම් කිරීම**

අයදුම් කිරීම මාර්ගගත ආකාරයෙන් (online) පමණක් අයදුම් කළ යුතු ය. ඒ සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ,

- නිල වෙබ් අඩවිය (https://doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති "Exam Information Center" මත Click කිරීම මගින් හෝ,
- https://onlineexams.gov.lk/eic වෙත පිවිසෙන්න.
- ඔබ වෙත දැනටමත් ලබාදී ඇති පරිශීලක නාමය (User Name) හා මුරපදය (Password) භාවිතා කර මාර්ගගත පද්ධතියට ප්‍රවේශ වන්න.

**02. විෂයය හා මාධ්‍ය**

පළමුවර විභාගයට ඉදිරිපත් වන අයදුම්කරුවන් විෂයයන් 9කට අනිවාර්යෙන් අයදුම් කළ යුතුය. අයදුම් පත්‍ර සම්පූර්ණ කිරීමේදී අයදුම්කරුවන්ගේ සම්පූර්ණ නම, මාධ්‍ය, විෂයය හා විෂයය අංක නිවැරදිව සම්පූර්ණ කිරීම විදුහල්පතිගේ හා විෂයභාර ගුරුභවතුන්ගේ වගකීමක් බව කරුණාවෙන් සලකන්න.

**03. මධ්‍යස්ථාන**

පසුගියවර ඔබ පාසලේ අයදුම්කරුවන් පෙනී සිටි විභාග මධ්‍යස්ථානයට වඩා පහසු මධ්‍යස්ථානයක් අදාළ නගරයේ ඇත්නම් එය වෙනස් කර දෙන ලෙස අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශ සහිත ලිපියක් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු ය.

**04. අයදුම්කරුගේ නම**

අයදුම්කරුගේ නම **උප්පැන්න සහතිකයේ** දැක්වෙන අයුරින්ම ඇතුළත් කළ යුතු ය. එසේ වාසගම ඇතුළත් නොකරන නමක් වේ නම්, දෙමාපියන්ගෙන් ඒ සඳහා ලිපියක් ලබාගෙන ගොනු කර තබාගත යුතු ය. **අයදුම්කරුවන්ගේ නම්වල අක්ෂර වින්‍යාසය හා නම්** දැක්වෙන **පිළිවෙළ** ඉතා නිවැරදි විය යුතු අතර ඒ සම්බන්ධ වැරදීම් සිදු නොවීමට වගබලා ගත යුතුය. හිස්තැන් ද සහිතව අකුරු අනුවකින් (90) යුත් නමක් පමණක් ඇතුළත් කළ හැකි අතර අකුරු අනුවට (90) වඩා දිගු නම් සඳහා නමෙහි පළමු කොටස (අවශ්‍යතාවය පරිදි) මුලකුරු යොදා කෙටි කර ගත යුතුය.

Ex :- ● DENIYEKUMBURA KADIGAMA WALAWWE GEDARA DISSANAYAKA MUDIYANSELAGE VISHWA CHAMARA AKASH INDRAJITH BANDARA

**D. KADIGAMA WALAWWE GEDARA DISSANAYAKA MUDIYANSELAGE VISHWA CHAMARA AKASH INDRAJITH BANDARA**

F/U. A16.4 Paper No Scheme App

**05. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් සඳහා විශේෂ අනන්‍යතා අංකය සැකසීම.**

මෙම විභාගය සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ දත්ත ඇතුළත් කරනු ලබන අවස්ථාවේ ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් සඳහා ඔබ විසින් විශේෂ අනන්‍යතා අංකයක් (Special unique code) ලබා දිය යුතුය. එය ඉලක්කම් 12කින් සමන්විත විය යුතු අතර පහත දැක්වෙන ආකාරයෙන් සකස් කර ගත යුතු වේ.

- විශේෂ අනන්‍යතා අංකය නිර්මාණය කිරීමේදී මුලින් **අයදුම්කරු උපන් වර්ෂය යොදන්න. ඉන් පසු 9 ඉලක්කම (විශේෂ අංකය ලෙස)** යොදා ඉන් පසු විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා දී ඇති **පාසල් අංකය** හා **අයදුම්පතේ අනු අංකය** ඇතුළත්ව ඉලක්කම් 12කින් සමන්විත වන ලෙස (පහත උදාහරණයන් වල සඳහන් පරිදි) විශේෂ අනන්‍යතා අංකය සකස් කර ගත යුතුය.

උදා : 1. අයදුම්කරු උපන් වර්ෂය 2010, **විශේෂ අංකය** 9, පාසල් අංකය 28519 සහ අයදුම්පතෙහි අනු අංකය 01 ද වන විට,
විශේෂ අනන්‍යතා අංකය : **201092851901** විය යුතු ය.

2. අයදුම්කරු උපන් වර්ෂය 2010, **විශේෂ අංකය** 9, පාසල් අංකය 1077 සහ අයදුම්පතෙහි අනු අංකය 60 ද වන විට,
විශේෂ අනන්‍යතා අංකය : **201091077060** විය යුතු ය.

**06. විෂයය හා විෂයය අංකය**

අධ්‍යාපන අමාත්‍යාංශ අංක 2006/09, 2007/06 හා 2007 මාර්තු මස 07 වැනි දින චක්‍රලේඛ අනුව අනිවාර්ය විෂයයන් 06 ද පළමු, දෙවන හා තෙවන විෂයය කාණ්ඩවලින් එක් විෂයයක් බැගින් ද වශයෙන් උපරිම විෂයන් 09 කට පෙනී සිටිය හැකි ය.

| විෂය අංකය | විෂයයන් |
|---|---|
| (11) සිට (16) තෙක් | ආගම |
| (21) | සිංහල භාෂාව හා සාහිත්‍යය |
| (22) | දෙමළ භාෂාව හා සාහිත්‍යය |
| (31) | ඉංග්‍රීසි භාෂාව |
| (32) | ගණිතය |
| (33) | ඉතිහාසය |
| (34) | විද්‍යාව |
| (60) සිට (75) තෙක් | පළමු විෂය කාණ්ඩය |
| (40) සිට (52) තෙක් | දෙවන විෂය කාණ්ඩය |
| (80) සිට (94) තෙක් | තෙවන විෂය කාණ්ඩය |

**07. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටීම**

පහත සඳහන් විෂයයන් හැර අනෙකුත් විෂයයන් සඳහා අයදුම්කරුවන්ගේ අභිමතය පරිදි ඉංග්‍රීසි මාධ්‍යයෙන් හෝ සිය මව් භාෂාවෙන් පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

- 40 - සංගීතය (පෙරදිග)
- 42 - සංගීතය (කර්ණාටක)
- 44 - නැටුම් (දේශීය)
- 45 - නැටුම් (භරත)

**08. විභාග ගාස්තු**

රජයේ පාසල්, ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් හා පිළිගත් පිරිවෙන්වලින් මෙම විභාගය සඳහා පළමු හා දෙවැනි වතාවට පෙනී සිටින අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් වේ.

තෙවනවර ඉදිරිපත් වන පාසල් අයදුම්කරුවන් පහත සඳහන් පරිදි විභාග ගාස්තු ගෙවිය යුතු ය.

| විෂයය ගණන | 1 | 2 | 3 | 4 | 5 | 06 - 09 තෙක් |
|---|---|---|---|---|---|---|
| ගාස්තුව | රු. 100/- | රු. 150/- | රු. 200/- | රු. 250/- | රු. 300/- | රු. 350/- |

මෙම විභාග ගාස්තු අයදුම්කරුවන්ගෙන් ලබාගෙන එකවර පහත සඳහන් ගිණුම වෙත බැර කර රිසිට්පත ලියාපදිංචි තැපෑලෙන් විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සලස්වන්න.

| | |
|---|---|
| ගෙවීම් ලබන්නා | - විභාග කොමසාරිස් ජනරාල් |
| බැංකුව සහ ශාඛාව | - ලංකා බැංකුව, පැලවත්ත. |
| ගිණුම් අංකය | - 7041229 |

HAL . A16 A/Paper No Schoo App

**09. දත්ත බාගත කර ගැනීම.**

බාගත කරගැනීමෙන් පසු මුද්‍රණය කරගත් අයදුම්පතෙහි **අයදුම්කරුවන්ගේ සම්පූර්ණ නම, අයදුම් කරන විෂයයන් (විශේෂයෙන් කාණ්ඩ විෂයන් සම්බන්ධයෙන්) , මාධ්‍යය** හා එහි දක්වා ඇති අනෙක් සියලු ම තොරතුරු නිවැරදි බවට තහවුරු කර ගෙන, අයදුම්කරුවන්ගේ අත්සන් ලබා ගත යුතු ය. එය අවශ්‍ය වුවහොත් පමණක් විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා සුරක්ෂිතව තබා ගන්න. මාර්ගගත පද්ධතියට දත්ත ඇතුළත් කිරීමෙන් පසු බාගත කරගත් PDF පිටපත සහ ඔබ විසින් පද්ධතියට ඇතුළත් කිරීම සඳහා යොදාගත් Excel ගොනුවේ සියලු ම තොරතුරු නැවත සංසන්දනය කර බලා සියලුම අයදුම්කරුවන්ගේ තොරතුරු නිවැරදිව ඇතුළත්ව ඇති බව තහවුරු කර ගැනීම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලාගේ හා විදුහල්පතිවරුන්ගේ පූර්ණ වගකීම වේ.

**10. විශේෂ අවශ්‍යතා අයදුම්කරුවන්**

ඔබ විද්‍යාලයෙන් දෘශ්‍යාබාධිත/ශ්‍රවණාබාධිත/ වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඔවුන් වෙනුවෙන් additional data of applicants with special education needs හි "Go to Data Form" Click කර එහි ඇති තොරතුරු සම්පූර්ණ කළ යුතුය. මෙවැනි විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති සිසුන් වෙනුවෙන් පහත සඳහන් විශේෂ විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන බැවින් එම මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

- අන්ධ විද්‍යාලය, රත්මලාන
- බිහිරි විද්‍යාලය, රත්මලාන
- අඳ / බිහිරි විද්‍යාලය, පොළොම්මාරුව, තංගල්ල
- සිව්රාජ් අන්ධ විද්‍යාලය, මහවැව
- රෝහණ අඳ/බිහිරි විද්‍යාලය, වැල්ගම, මාතර

**11. අනන්‍යතාව ඔප්පු කිරීම**

මෙම විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකුම තම අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ඉදිරිපත් වන විට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතු ය. ජාතික හැඳුනුම්පත වෙනුවට ඉදිරිපත් කළ හැක්කේ **වලංගු විදේශ ගමන් බලපත්‍රය** හා **වලංගු රියදුරු බලපත්‍රය** පමණි. වෙනත් කිසිදු හැඳුනුම්පතක් වලංගු හැඳුනුම්පතක් ලෙස පිළිගනු නොලැබේ. **එබැවින් කල්වේලා ඇතිව ජාතික හැඳුනුම්පත සිසුන්ට ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දීම විදුහල්පතිවරුන්ගේ වගකීමකි.**

**12. විමසීම්**

මෙම විභාගය සඳහා මාර්ගගත (online) ක්‍රමය මගින් දත්ත ඇතුළත් කිරීම සම්බන්ධයෙන් යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වුවහොත් පහත සඳහන් ලිපිනයෙන්, විද්‍යුත් තැපෑල මගින් හෝ දුරකථන අංක මගින් විමසීම් කළ හැකිය.


විභාග කොමසාරිස්<br>
පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව<br>
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව<br>
තැ.පෙ. 1503, කොළඹ.

විද්‍යුත් තැපෑල : gceolexamsl@gmail.com<br>
දුරකථන අංක : 011-2784208 011-2784537 011-2785922<br>
ෆැක්ස් අංක : 011-2784422

**මාර්ගගත ඒකකය**<br>
දුරකථන අංක : 011-3671568 011-3661122

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ<br>
විභාග කොමසාරිස් ජනරාල්


H:\U...A6\4\Paper No Schoo App